www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ටෙරී ෂියාවෝ සහ එක්සත් ජනපදය තුල දේශපාලනයෙහි හා සංස්කෘතියෙහි අර්බුදය

**The case of Terri Schiavo and the crisis of politics and culture in the United States**

**ඩේවිඩ් නෝර්ත් විසිනි**
**2005 අප්‍රේල් 4**

*පහත දැක්වෙනුයේ සමාජවාදී සමානතා පක්ෂයේ ලේකම් හා ලෝක සමාජවාදී වෙබ් අඩවියේ කර්තෘ මන්ඩලයෙහි සභාපති ඩේවිඩ් නෝර්ත් අප්‍රේල් 3 වන ඉරිදා නිව් යෝර්ක්හි පැවැත්වුනු ප්‍රසිද්ධ රැස්වීමක දී කරන ලද දේශනය යි.*

ජාතීන්ගේ ජීවිතයෙහි ඇතැම් අවස්ථාවල භ්‍රාන්තික, අශෝභන, අනපේක්ෂිත සිද්ධියක් හට ගැනෙන අතරෙහි, එය පෙර දැකිය නො හැකි වන ආකාරයකට දශ ලක්ෂ සංඛ්‍යාත මිනිසුන්ගේ අවධානයට පාත්‍ර වෙමින් ගැඹුරු ඓතිහාසික, දේශපාලනික හා සදාචාරාත්මක ප්‍රශ්න උද්ගත කරවයි. එමගින් සිද්ධිය දිග හැරෙන සමාජය පිලිබඳ ව අත්‍යන්තයෙන් ජුගුප්සිත සත්‍යයන් අනාවරනය කෙරේ. ටෙරී ෂියාවෝ පිලිබඳ සිද්ධිය එවැන්නකි. මෙම අභාග්‍ය සම්පන්න කාන්තාවගේ හා ඇගේ අවරෝධිත ස්වාමිපුරුෂයාගේ ඉරනම සම්බන්ධිත ව හට ගැනී තිබෙන විවාදය එක්සත් ජනපදයේ විසකුරු සමාජ පරස්පර විරෝධයන් පෙරී එන්නා වූ ප්‍රිස්මයකි.

ටෙරී ෂියාවෝගේ මරනය එක් පවුලක පුද්ගලික ඛේදවාචකයකට වැඩි යමක් නො විය යුතු ව තිබුනි. වසර 15කට පූර්වයෙන් ෂියාවෝ මහත්මිය පෙලූ මොලයේ ආබාධය ආන්තික ස්වරූපයක් ගත්තේ ය. එයින් ඇයට සවිඥාන පැවැත්මෙහි සියලුම අංගෝපාංග අහිමි විය. එයින් ඇගේ ජීවිතය හුදෙක් සක්‍රිය ජීව විද්‍යාත්මක සන්තතීන්ගේ සමස්තය හැරුනු විට වෙනයම් දෙයකින් තොර වන තත්වයට පත් විය. ඇගේ ස්වාමිපුරුෂයා මුහුන දුන් ප්‍රශ්නය එක්සත් ජනපදය තුල අසංඛෙය ස්වාමිපුරුෂයන් හා බිරින්දෑවරුන් එමෙන් ම නිශ්චිත කොන්දේසිවලට අනුව දෛනික ව මාපියවරුන් හා දරුවන් මුහුන දෙන ප්‍රශ්නයකි.

අපගේ ජීවිතවල කිසියම් මොහොතක, අප ආදරය කරන කෙනෙකුට දෙනු ලැබෙන වෛද්‍ය ආධාර සීමා කරනවා ද නැතහොත් සම්පූර්නයෙන් ම නතර කරනවා ද යන්න වෛද්‍යාචාර්යවරුන් හා සාකච්ඡා කොට තීන්දු කිරීමට අපට බල කෙරෙන අවස්ථාවක් එලඹීමට අවකාශ ඇත. අපට අපේක්ෂා කල හැකි එක ම දෙය එබඳු කොන්දේසි උද්ගත වුව හොත්, රාජ්‍යයේ ද මූලධර්මවාදී හා නව ෆැසිස්ට්වාදී මුග්ධයන්ගේ ද ජන මාධ්‍යවල සිටින පාදඩයන්ගේ ද මැදිහත් වීම්වලින් තොර ව අප හමුවෙහි පවත්නා සැබෑ වෛද්‍ය විද්‍යාත්මක විකල්පයන් පිලිබඳ බුද්ධිමත් තක්සේරුවකට හා රෝගියාගේ පුද්ගලික ප්‍රාර්ථනාවන් පිලිබඳ අවබෝධයට අනුව තීන්දුවක් ගැනීමට අපට අවස්ථාව ලැබේ ය යන්න යි.

මෙම විශේෂිත සිද්ධිය ජාතික ප්‍රශ්නයක මට්ටමට එසවේ යැයි කිසිවකුට පෙර දැකීමට නො හැකි විය. එහෙත් දැන් මෙය සිදු වී ඇති හෙයින් මෙම සිද්ධිය මෙතරම් දැවැන්ත පරිමාවකට නැග ගනීය යන කරුන එතරම් පුදුම සහගත වන්නේ ද නැත. මෙම සුවිශේෂ සිද්ධියට කොන්දේසි සම්පාදනය කලා වූ සුවිශේෂ ජාතික පරිසරය දශක ගනනාවක දේශපාලනික, සමාජීක — මෙයට මවිසින් බුද්ධිමය යන්න ද එකතු කල යුතු වෙයි — පරිහානියක ප්‍රතිඵලය වෙයි.

සත්තකින් ම මූලධර්මවාදී වාචාල කතා හා ගොඩ වෙදකම් එක්සත් ජනපදයට අලුත් දේවල් නො වේ. එහෙත් මින් පෙර කිසි ම දාක ජාතික ආන්ඩුවත්, බලයෙහි සිටින දේශපාලන පක්ෂයත් ක්‍රිස්තියානි මූලධර්මවාදයේ ඇමරිකානු ශෛලිය තමන්ගේ දෘෂ්ටිවාදය හැටියට වැලඳ ගත්තේ නැත. එසේ ම ප්‍රතිගාමී මූලධර්මවාදී සංවිධානයන්ගේ පෘථුල ජාලයකින් ජනතා දේශපාලනික ඡන්ද දායක කොට්ඨාශයක් වර්ධනය කර ගැනුමට මාන බැලුවේත් නැත.

ඇමරිකානු ඉතිහාසයේ පුරෝගාමී හා වඩා සෞඛ්‍ය සම්පන්න කාල පරිච්ඡේදවල මූලධර්මවාදී මුග්ධ භාවය හා වාචාල භාවය ජාතික හාස්‍යයට බඳුන් වූ අයුරු එච්.එල්. මෙන්කන්ගේ රචනාවලින් හා සින්ක්ලෙයා ලුවිස්ගේ නවකතාවලින් දැක ගත හැකි ය. ඇමරිකානු තරුන පරම්පරා කිහිපයක් ම *ඉන්හෙරිට් ද වින්ඩ්* (සුලඟ උරුම කර ගන්න) නමැති නාට්‍යයෙන් හා චිත්‍රපටයෙන් බයිබලයේ පිටු පෙරලන මූලධර්මවාදයේ අභූත භාවය වටහා ගත්හ. 1925 හි ස්කෝප්ස් නඩු විභාගය *ඉන්හෙරිට් ද වින්ඩ්* නිර්මානයට විෂය විය. ස්කෝප්ස් නඩු විභාගය, ඇමරිකාවේ විද්‍යාවෙහි, තර්කනයෙහි හා ප්‍රගතියෙහි බලවේගයන්ට එරෙහි ව ආගමික උද්දච්ච භාවයේ හා මුග්ධ භාවයේ අවසන් ශෝචනීය ආස්ථානය හැටියට සලකනු ලැබින.

අවුරුදු 80කින් ඇමරිකාව කෙතරම් නම් අගාධයකට

ඇද වැටී ඇද්ද? රටෙහි ඒ හෝ මේ ජනපදයෙහි පරිනාමවාදී විද්‍යාවන් උගැන්වීමට එරෙහි ව නඩු මගට අවතීර්න වීමේ සැබෑ ඉඩකඩක් නොමැති යයි අද දින කවරකුට නම් ආත්ම විශ්වාසයෙන් යුතු ව පැවසිය හැකි වන්නේ ද? නඩු මගට අවතීර්න වීමක් ඇති ව නැති ව දැනටමත් පරිනාමවාදය සැලකිය යුතු උසස් අධ්‍යාපන ආයතන ප්‍රමානයක පාඨ මාලාවන් කෙරෙන් පිටමං කෙරී ඇත. නැතහොත් එය නිර්මානවාදී හා "බුද්ධිමත් ආකෘතිය" පිලිබඳ මිථ්‍යා මතවාදයන් විසින් ඉදිරිපත් කෙරෙන, බයිබලය පාදක කර ගත් අදහස් හා සම තැන් ගන්නා හුදු සමපේක්ෂනාත්මක න්‍යායක් හැටියට ඉදිරිපත් කෙරේ.

ෂියාවෝ සිද්ධියට බුෂ් පරිපාලනයෙහි මැදිහත් වීම එමගින් සංවිධාන කෙරෙන විද්‍යා විරෝධී අධිකරනය පිලිබඳ ව වඩාත් ම දෘෂ්‍යමාන නිදර්ශනය පමනක් වන්නේ ය. විද්‍යාත්මක පර්යේෂනයන් විකෘත කිරීම හා පිරිහෙලීම, එක්සත් ජනපදයේ මහජන ජීවිතය තුල එන්න එන්න ම වඩවඩා පෘථුල වන හා උන්මාදනීය වන ප්‍රකාශනයන් අත්පත් කර ගනිමින් සිටී. නිදර්ශනයක් වශයෙන් 2003 හි දී අභ්‍යන්තරික කටයුතු පිලිබඳ දෙපාර්තමේන්තුව, මහා ආවාටය පිලිබඳ ජාතික උද්‍යානයෙහි නිල පුස්තකාලයෙහි *මහා ආවාටය: නව විවරනයක්* නමැති කෘතියක් තැන්පත් කලේ ය. මෙම කෘතිය, ශත වර්ෂාධික කාලයක් තුල කෙරුනු භූ විද්‍යාත්මක පර්යේෂනයන් විසින් තහවුරු කෙරුනු අවබෝධයට එනම්, මහා ආවාටය වසර දශ ලක්ෂ සංඛ්‍යාත කාලයක් මුලුල්ලේ සිද්ධ වූ විපරිනාමයෙහි ප්‍රතිඵලයක් වන්නේ ය යන අවබෝධයට එරෙහි ව තර්කනයක නිරත වෙයි. ඒ වෙනුවට එයින් පැවසෙනුයේ මහා ආවාටය වසර දහස් ගනනකට පෙර ඇති වූ එක් විනාශකාරී සිදු වීමක ප්‍රතිඵලය වන බව ය. එනම්, බයිබලයේ සඳහන් වන මහා ජල ගැල්මට සමාන වූ සිදු වීමකි. භූ විද්‍යාත්මක සංගම්වල ප්‍රකුපිත විරෝධය නො තකා මෙම ආගමික ලියවිල්ල තවමත් ආන්ඩුවේ මුදල් ලබන මෙම ජාතික උද්‍යානයෙහි තැන්පත් කෙරී ඇත. ["The Attack on Science, ("විද්‍යාවට එල්ල කෙරෙන ප්‍රහාර)., මාජරී හයින්ස්, දෙසැම්බර් 21, 2004, කොමන් ඩ්‍රීම්ස් තොරතුරු මධ්‍යස්ථානය, www. commondreams.org]

තැකීම් සහගත විද්‍යාඥයන්ගේ සංගමය, තත්වයෙහි බරපතල කම පිලිබඳ ව, "ප්‍රතිපත්ති සම්පාදනයෙහි විද්‍යාත්මක අවංක භාවය: බුෂ් පරිපාලනය විසින් විද්‍යාව අපචාරයෙහි යෙදවීම" සම්බන්ධයෙන් 2004 මාර්තුවෙහි නිකුත් කල ලිපියකින් අවධානය යොමු කලේ ය. පර්යේෂනයෙහි ප්‍රධාන සොයා ගැනීම් මෙසේ ය:

"1. බුෂ් පරිපාලනයෙහි දේශපාලනික පත්වීම් ලද ඉහල පෙලේ තනතුරු දරන්නවුන් විසින්, ෆෙඩරල් ආයතන ගනනාවක් ඔස්සේ, විද්‍යාත්මක සොයා ගැනීම් මර්දනය කිරීමේ හා විකෘත කිරීමේ මැනවින් ස්ථාපිත වැඩ සටහනක් පවත්වා ගෙන යනු ලැබේ. මෙම ක්‍රියා මානුෂ සෞඛ්‍යය, මහජන ආරක්ෂාව හා සමාජික යහ පැවැත්ම යන අංශ කෙරෙහි බල පවත්වයි.

"2. පරිපාලනයෙහි දේශපාලනික වැඩ පිලිවෙලට පටහැනි ව යන උපදෙස් වලක්වාලීම පිනිස ආන්ඩුවේ විද්‍යාත්මක උපදේශ පද්ධතිය හසුරුවාලීමේ පෘථුල පරිමාන උත්සාහයක් පිලිබඳ ව බලගතු ලියවිලි පවතී.

"3. ඇවිලෙනසුලු මාතෘකා පිලිබඳ ව ආන්ඩුවේ විද්‍යාඥයන්ට ලියන්නට කියන්නට පුලුවන් දෑ මත පරිපාලනය බොහෝවිට වාරන පවරන බවට සාක්ෂි පවතී.

"4. බුෂ් පරිපාලනය විසින් විද්‍යාව හසුරුවාලීමේ, මර්දනය කිරීමේ හා සාවද්‍ය ලෙස ඉදිරිපත් කිරීමේ පරිමාව පෙර නො වූ විරූ මට්ටම්වලට ඉහල ගොස් ඇති බවට සැලකිය යුතු සාක්ෂි පවතී.

මෙම වාර්තාවට එක්සත් ජනපදයෙහි නෝබල් ත්‍යාග ලාභීන් ඇතුලු 60කට වැඩි ප්‍රමානයක් ප්‍රධාන පෙලේ විද්‍යාඥයන් අත්සන් තබා තිබුනි.

ටෙරී ෂියාවෝ සිද්ධියෙහි උමතු සහගත නිර්ලජ්ජී හා පරිහානි සහගත උත්ප්‍රේක්ෂාවට එතරම් දැවැන්ත දේශපාලනික කලබැගෑනියක් කල හැකි වනුයේ විද්‍යාත්මක චින්තනය බන්ධන ගත කෙරෙන රටක පමනි. ධවල මන්දිරය, කොන්ග්‍රසය, ෆ්ලොරිඩා ජනපදයෙහි ව්‍යවස්ථා දායකය හා ආන්ඩුකාරයා මූලධර්මවාදී දක්ෂිනාංශය ද කැටුව ව්‍යවස්ථාව පාගා දමා ඇත්තේ මීට 15 වසරකට පෙර සවිඥාන ජීවිතයෙන් සමු ගත් ස්ත්‍රියක "බේරා ගැනුම" සඳහා ය.

ජන මාධ්‍ය, "ටෙරී බේරා ගැනුමේ" උද්ඝෝෂනයෙහි මුසාවාද හා සාවද්‍ය තොරතුරු පුම්බනවා පමනක් නො ව මයිකල් ෂියාවෝට එරෙහි ව ප්‍රචන්ඩත්වය දිගේලි කිරීමට විවෘත වේදිකාවක් ද සම්පාදනය කරයි. එපමනක් නො ව එම ප්‍රචන්ඩත්වය, ෂියාවෝ මහත්මියගේ අවිඥාන කායික පැවැත්ම පවත්වා ගෙන යාමට උපකාරී වූ කොන්දේසි ඉවත් කිරීමට ඇගේ කැමැත්ත පරිදි ඉඩ සැලසූ විනිශ්චයකරුවන්ට — ඔව්හු එසේ ඉඩ සැලසීමේ දී මූලික ව්‍යවස්ථාපිත මූලධර්ම ආරක්ෂා කලහ — විරුද්ධ ව ද මෙහෙයවනු ලැබේ.

එක්සත් ජනපදයෙහි දේශපාලනික හා බුද්ධිමය ජීවිතයේ ජුගුප්සජනක පරිහානිය ප්‍රකාශයට පත් වනුයේ, හුදෙක් සරල ව, අන්ත දක්ෂිනාංශයේ උසිගැන්වීමෙන් පමනක් නො වේ. සම්ප්‍රදායික ව ප්‍රජාතාන්ත්‍රික අයිතීන්හි ආරක්ෂකයන් හා සමාජ ප්‍රගමනයට පිටුබලය සපයන්නන් හැටියට පෙනී සිටි ඩෙමොක්‍රටික් පක්ෂයේ හා අනෙක් බලවේගවල තුච්ඡ යටත් වීමෙන් ද එය ප්‍රකාශයට පත් වෙයි. ඩෙමොක්‍රටික් පක්ෂයේ අනුමැතියෙන් තොර ව, රිපබ්ලිකන්වරුන්ට, කොන්ග්‍රසය තුල ඔවුන්ගේ නග්න ලෙස ව්‍යවස්ථා විරෝධී වූ "ටෙරීගේ නීතිය" සම්මත කර ගැනුමට නුපුලුවන් වන්නේ ය. "ටෙරීගේ නීතිය" මාන බලනුයේ ව්‍යවස්ථාදායකයේ අනුහසින් මූලික ප්‍රජාතාන්ත්‍රික අයිතීන් කප්පාදු කිරීම නීත්‍යානුකූල කිරීමට ය.

ෂින්ඩ්ලර් පවුලෙහි අලුත් ම අභියාචන පෙත්සම ප්‍රතික්ෂේප කිරීමේ තීන්දුවෙහි, 11 වන සංචාරක උසාවියෙහි විනිශ්චයකරු බර්ච් සමාන්තර ප්‍රකාශයක් නිකුත් කලේ ය. "අපේ ආන්ඩුවෙහි ව්‍යවස්ථාදායකය හා විධායකය නිදහස් ජනතාවක් පාලනය කිරීමේ අපේ ආරම්භක පීතෘවරුන්ගේ කෙටුම්පතට එනම් අපේ ව්‍යවස්ථාවට පැහැදිලි ලෙස ම එරෙහි වන ආකාරයකින් ක්‍රියා කොට ඇත්තේ ය"යි ඔහු අනතුරු ඇඟවිය. උසාවි ලේඛනයෙහි අවධාරනය කොට දැක්වෙන වගන්තියකින් ඔහු තවදුරටත් මෙසේ සඳහන් කලේ ය. "අධිකරනයේ නිදහස සම්බන්ධයෙන් අද දින කැප කිරීම් කෙරෙතොත් එමගින් හෙට දින ව්‍යවස්ථාමය උල්ලංගනයන්ට පූර්වාදර්ශයක් සම්පාදනය කෙරෙන්නේ ය."

මෙම පුදුමාකාර අනතුරු ඇඟවීමෙහි බැරෑරුම් කම ඩෙමොක්‍රටික් පක්ෂයේ නායකයන්ගේ ක්‍රියා කලාපයන්හි තබා ප්‍රකාශනයන්හි වත් දෝංකාර නො දේ. සත්තකින් ම ෂියාවෝ මහත්මියගේ මරනයෙන් අනතුරුව, නියෝජිත මන්ත්‍රී මන්ඩලය පාලනය කරන ටොම් ඩිලේ නමැති නීච දාමරිකයා, ප්‍රචන්ඩාකාරයෙන් පලිගැනීම උදෙසා කල ඉල්ලීම්වලටත් ඩෙමොක්‍රටික් පක්ෂය ප්‍රතිචාර නො දැක්වූ තරම් ය. ඩිලේ, ඩෙමොක්‍රටික් පක්ෂයේ නායකයන් ඝාතනය කිරීම පිලිබඳ ව විවෘත ව කතා කරන විටත් මෙම ඊනියා විරුද්ධ පක්ෂයේ නායකයන්ට ලජ්ජාශීලී හා බියගුලු තරවටු කිරීම්වලින් ඔබ්බට යමක් කිරීමට නුපුලුවන් විය.

මෙම කරුනින් උපුටා ගත යුතු වන නිගමනය වනුයේ ඩෙමොක්‍රටික් පක්ෂය ව්‍යවස්ථානුකූල අයිතීන් ආරක්ෂා කිරීමෙහි ලා පරිපූර්න වශයෙන් අපොහොසත් වන බව හා ඒ සම්බන්ධයෙන් ඔවුන්ට තැකීමක් නොමැති බව ය. පසුගිය දශක දෙකක කාලය තුල ඩෙමොක්‍රටික් පක්ෂයේ දේශපාලනික පරිනාමය කිසියම් පරිමානයක හෝ බැරෑරුම්කමකින් අන්වේක්ෂනය කල කෙනෙකුට මෙම දේශපාලනික කරුන පුදුමයට හේතුවක් නො වන්නේ ය. ප්‍රතිපත්ති පිලිබඳ සියලුම තීරනාත්මක ප්‍රශ්නවල දී බුෂ් පරිපාලනයට ඩෙමොක්‍රටික් පක්ෂයේ දීන යටත් වීම ගැන මෙහි දී සඳහන් කල යුතු නො වේ. එය, ඉරාකයට නීති විරෝධී ආක්‍රමනයක් දියත් කිරීම හා දේශ මාමක පනතින් පෙන්නුම් කෙරෙන පරිදි ප්‍රජාතාන්ත්‍රික අයිතීන් දැවැන්ත ලෙස බන්ධනය කිරීමෙහි සිට, 1930 හා 1960 අතරෙහි ක්‍රියාත්මක කෙරුනු ශුභ සාධක නීතිවලින් යමක් ශේෂ ව පවත්නේ ද ඒවා ගිනි බත් කිරීම දක්වා දිවේ.

ඇමරිකානු ලිබරල්වාදය සමග සම්ප්‍රදායික ව සම්බන්ධ කෙරෙන වෙනත් දේශපාලනික සංවිධාන, ටෙරී ෂියාවෝ සිද්ධියට දක්වන ප්‍රතිචාරයෙන් ඇඟවුම් කෙරෙනුයේ, ඩෙමොක්‍රටික් පක්ෂයේ බෙල හීන යටත් වීම මගින් වඩා ගැඹුරු සමාජ සන්තතියක් පිලිබිඹු කෙරෙන බව ය. පසුගිය සතිය තුල ෂියාවෝ මහත්මියට නැවත පෝෂක නාල බද්ධ කිරීමේ දේශපාලනික උද්ඝෝෂනයට ජෙසී ජැක්සන්, රැල්ෆ් නාඩර් හා අවධානයට පාත්‍ර ව සිටින පුවත්පත් කලා වේදියකු වන නැට් හෙන්ටොෆ්ගේ ද සහයෝගය ලැබුනි. රැල්ෆ් නාඩර් සිවිල් අයිතීන් ආරක්ෂා කරන්නකු හැටියට බොහෝවිට අභිනන්දනයට පාත්‍ර වන්නෙකි.

ඔහු විලේජ් වොයිස් (ගමෙහි හඬ) නමැති ප්‍රකාශනයට ලියන මාධ්‍ය වේදියෙකි. මෙම පුද්ගලයන්ගේ ප්‍රකාශනවල දේශපාලනික ඵලය වනුයේ මහජන මතය මංමුලා කොට අන්ත දක්ෂිනාංශයේ ක්‍රියාවන් යුක්ති සහගත කිරීම යි. මෙම පුද්ගලයන්ගේ ප්‍රකාශන කැපී පෙනෙනුයේ, හුදෙක් ඒවායෙහි ගැබ් වන අවස්ථාවාදය — දේශපාලනික ව ඉස්මතු වන දක්ෂිනාංශය හා සන්ධාන ගත වනු වස් මාවතක් පාදා ගැනුමේ පැහැදිලි උත්සාහය — නිසා පමනක් ම නො වේ; ඊටත් වඩා එම ප්‍රකාශන කැපී පෙනෙනුයේ ඒවායෙහි බුද්ධිමය ග්‍රාම්‍යත්වය හා මුසාවාදීමය ගති ස්වභාවය නිසා ය.

ජැක්සන්ගේ මැදිහත් වීම චිරකාලීන හොර වෙදෙකුගේ හා දේශපාලනික විගඩම්කරුවකුගේ ක්‍රියාවක් හැටියට ගසාබසා දැමීමට බැරිකමක් නැත. එහෙත් නාඩර්ගේ ප්‍රකාශය එපරිද්දෙන් නො බැරෑරුම් ලෙස නො තකා සිටිය නො හැකි ය. ඔහු කිහිප වතාවක් ජනාධිපති ධුරය සඳහා උද්ඝෝෂන දියත් කලේ ය. එම උද්ඝෝෂනවල දී ඔහු සංගත විසින් පරිපාලිත ද්විපක්ෂ ක්‍රමයට වාමාංශික විකල්පයක් හැටියට පෙනී සිටියේ ය. නාඩර් *නැෂනල් රිවීව්* (ජාතික නිරීක්ෂනය) නමැති ප්‍රකාශනයට නිරතුරුව ලිපි සම්පාදනය කරන වෙස්ලි ජේ. ස්මිත් සමග ඒකාබද්ධ ප්‍රකාශනයක් නිකුත් කර ඇත. එහි මෙසේ සඳහන් වෙයි. "ටෙරී ෂියාවෝ බරපතල අසාධාරනයකට පාත්‍ර කෙරී ඇත. ඊටත් වඩා දුෂ්ට වනුයේ දාව හරනයෙන් ක්‍රමක්‍රමයෙන් සිදු කෙරෙන මරනය නීතියේ පිටුබලය සම්බන්ධිත පැහැයකින් යුතු ව සිදු කරනු ලැබීම යි. නඩු විභාගයෙහි දී සැකය පිලිබඳ සෑම වාසියක් ම — මෙහි දී සැක කටයුතු බොහෝ කරුනු වෙයි — ඇගේ ජීවත් වීම වෙනුවෙන් නො ව මරනය වෙනුවෙන් පරිහරනය කරනු ලැබින."

සැක සාංකාවන්? බොහෝ සැක සාංකාවන්? කාගේ සැක සාංකාවන් ද? විද්‍යාඥයන් හා ස්නායු විද්‍යාඥයන් අතරෙහි සිටින පුද්ගලයන්ගේ? විඥානයේ රසායනික හා කායික විද්‍යාත්මක පදනම් පිලිබඳ ව අවබෝධයක් ඇත්තවුන් අතරෙහි සිටින පුද්ගලයන්ගේ? ෂියාවෝ මහත්මියගේ සෞඛ්‍ය තත්වයෙහි පරම වශයෙන් ම අපේක්ෂා විරහිත ස්වභාවය පිලිබඳ ව — ඇය ස්වයං විඥානයෙන් තොර වීම පිලිබඳ ව, බාහිර ලෝකය හඟින්නට ඇගේ අපොහොසත් කම පිලිබඳ ව ඓන්ද්‍රිය දත්තයන් සලකා බැලීමට ඇගේ නොහැකියාව පිලිබඳ ව — සුප්‍රකට ස්නායු විද්‍යාඥයන් අතරෙහි කිසිදු සැකයක් නො වීය.

ෂියාවෝ මහත්මියගේ නිෂ්ක්‍රිය තත්වය පිලිබඳ ව

රෝග විනිශ්චය ගැන යම්කිසි පරිමානයක සැකයක් තිබේ. ඇගේ තත්වය නිසා ම රෝගියා ඉතා අඳුරු සීමා සහිත සංවේදනාත්මක දැනුවත් කමකින් යුක්ත ද යන්න පරම වශයෙන් නිශ්චය කොට පැවසීමට නුපුලුවන. ෂියාවෝ මහත්මියගේ මොලයෙහි තත්වය සැලකිල්ලට ගත් කල්හි ඇයට ඉතා අඳුරු සංවේදනාත්මක දැනුවත්කමක් පවතී ය යන්න ද ප්‍රතික්ෂේප කල හැකි නො වේ. එහෙත් එබඳු තත්වයක් සිතා ගැනුමට නුපුලුවන් වන පමනට බේදජනක ය. මන්ද එහි අර්ථය වනුයේ ෂියාවෝ මැතිනියට වසර 15ක් මුලුල්ලේ සිතා ගැනුමට නුපුලුවන් මට්ටමේ පීඩාවක් සන්නිවේදනයකින් තොර ව නිහඬ ව දැරීමට සිදු ව ඇත යන්න වන හෙයිනි.

නැට් හෙන්ටොෆ් *විලේජ් වොයිස්* නමැති ප්‍රකාශනයට සම්පාදනය කල කොලම ගැන යමක් සඳහන් කිරීමට මට අවසර දෙන්න. එම කොලම විශාල වශයෙන් සමන්විත වනුයේ මයිකල් ෂියාවෝට එරෙහි ව කෙරෙන දෝෂාරෝපනයකිනි. "තම බිරිඳ මරා දැමීමේ බලගතු ඕනෑකමක් ඔහු තුල බල පවත්වා ඇතැ"යි නැට් හෙන්ටොෆ් ද්වේෂ සහගත ව මයිකල් ෂියාවෝට දොස් නගයි. දක්ෂිනාංශික සන්නිවේදන මාධ්‍යවල ෂියාවෝට එරෙහි ව එල්ල කර තිබෙන දෝෂාරෝපන හෙන්ටොෆ් විසින් පුනරුච්චාරනය කෙරේ. "ෂියාවෝ තම බිරිඳගේ ආරක්ෂකයා හැටියට තමන්ට පැවරුනු නීත්‍යානුකූල වගකීම් ලැයිස්තුවක් ම බන්ඩය කොට ඇතැ" යි ද "ඉන් ඇතැම් ඒවා ඇයට සුවය ලබන්නට පැවති අවකාශ ඇහිරීම වන්නේ ය"යි ද හෙන්ටොෆ් පවසයි. ෂියාවෝ තවත් ස්ත්‍රියක සමග පවිටු සම්බන්ධතාවක් පවත්වා ගෙන යාම පිලිබඳ ව හෙන්ටොෆ් කුපිත ව සිටී. මයිකල් ෂියාවෝට තම බිරිඳ ජීවතුන් අතරෙහි තබා ගැනුමට හා ඇයට පුනර්ජීවනය ලබා දීමට අවශ්‍ය නො වනුයේ ඒ නිසා යැයි ද ඔහු ඇඟවුම් කරයි. ෂියාවෝ පිලිබඳ ව, ද්වේෂ සහගත මාධ්‍ය වේදියකු විසින් අඳින ලද මෙම විසකුරු චිත්‍රය, මැනවින් තහවුරු කෙරී ඇති සාධක මගින් නිෂ්ප්‍රභ කෙරේ. මේ සිද්ධිය පිලිබඳ ව ප්‍රධාන ජන මාධ්‍ය ධාරාවේ පල වී ඇති අල්ප ප්‍රමානයක් අවංක ලේඛන අතරෙහි, අලුත් ම *නිව්ස් වීක්* සඟරාවෙහි දැක්වෙන වාර්තාව ද වෙයි. හෙන්ටොෆ්ගේ ලියවිල්ල නිෂ්ප්‍රභ කරන, මැනවින් ස්ථාපිත කෙරී ඇති සාධක සාරාංශ ගත කොට, *නිවුස් වීක්* සඟරාවෙහි දක්වා තිබේ.

"ඇගේ රෝගයේ ආරම්භක අදියරෙහි මයිකල් හා ෂින්ඩ්ලර්වරු මිත්‍රශීලි ව ජීවත් වූහ. කලක් ඔව්හු ගල්ෆ් කෝස්ට්හි එක ම නිවසක පවා ජීවත් වූහ. ඔව්හු ටෙරී හට විවිධාකාරයේ රෝග නාශක පිලියම් — කායික, පුනර්ජීවක — ලබා දුන්හ. ඒවායින් ඵලයක් නො වූ විට මයිකල් ඇය ගුවනින් කැලිෆෝනියාවට රැගෙන ගියේ ය. එහි දී වෛද්‍යාචාර්යවරයකු අත්හදා බැලීමක් හැටියට ඇගේ මොලයෙහි විද්‍යුත් ද්වාර තැන්පත් කලේ ය. එහෙත් එය ද අසාර්ථක විය. ආපසු ෆ්ලොරිඩාවට පැමිනි පසු ව මයිකල් ඥාතීන්ගෙන් ඔවුන්ගේ කටහඬවල් පටිගත කර දෙන මෙන් ඉල්ලුම් කලේ කැසට් යන්ත්‍රයක් මගින් ටෙරීට අසන්නට සැලැස්වීමට ය. ටෙරීගේ පෙනුම ගැන ඔහු ඉතාමත් ම සැලකිලිමත් විය. ඔහු ඇගේ සිරුරෙහි පිකාසෝ සුවඳ ද්‍රව්‍ය ආලේප කලේ ය. ඔහු ඇයට කලිසම් ද ඊට ගැලපෙන කමිස ද ඇන්දවිය. ඔහු ඒවා මිල දී ගත්තේ ද ලිමිටඩ් නමැති වෙලඳ ආයතනයෙනි. ෆ්ලොරිඩාවෙහි එක්තරා සාත්තු නිවාසයක දී ඔහු කෙතරම් අභියෝග කාරක වූයේ ද යත් එහි පාලකයෝ ඔහු මඩිනු පිනිස නීතියේ පිහිට පැතූහ. එහෙත් එකල එහි වැඩ කල ග්ලෝරියා සෙන්ටොන්ස් (පසු ව ඈ මයිකල්ගේ අනාගත සහකාරිය අයත් වන පවුල හා විවාහ සම්බන්ධයක් ඇති කර ගත්තේ ය.) මෙවැන්නක් සඳහන් කරයි. සාත්තු සේවිකාවෝ බොහෝවිට මෙසේ සඳහන් කලහ. 'ඔහු අවජාතකයෙකු වුවත් මා අසනීපයෙන් පසු වනවා නම් ඔහු මගේ ස්වාමිපුරුෂයා වනවාට මම කැමැත්තෙමි' වඩා හොඳින් ටෙරී බලා ගනු පිනිස, මයිකල් සාත්තු සේවා පාසැලකට බැඳී පුහුනුව ලැබී ය."

හෙන්ටොෆ්, ෂියාවෝ මහත්මියගේ තත්වය පිලිබඳ ව සියලුම විද්‍යාත්මක හා වෛද්‍ය විද්‍යාත්මක සාක්ෂි සරල ව ම නො තකා හරියි. ඉක්බිති ව ඔහු ෂියාවෝ මහත්මිය කිසි ම විටක "පරිසමාප්ත ස්නායු පරීක්ෂනයකට" බඳුන් නො කෙරුනේ යැයි මුසාවක් ද බෙනෙයි. සත්‍යය නම් ෂියාවෝ මහත්මිය ඉතා සියුම් පරීක්ෂනයන්ට බඳුන් කෙරුනේ ය යන්න යි. එම පරීක්ෂන කරනු ලැබුනේ පුහුනු ස්නායු වෛද්‍යවරුන් විසිනි. මෙම පරීක්ෂනවලින් සොයා ගැනුනු කරුනු අධිකරනයෙහි දී විවේචනාත්මක නිරීක්ෂනයන්ට බඳුන් කෙරුනි. 1996 දී සහ 2002 හි දී ඇගේ මොලය පිලිබඳ ව සීඒටී ස්කෑන් දෙකක් කරනු ලැබින. එම්.එස්.එන්. ගුවන් විදුලි සේවය විසින් පසුගිය සතියෙහි සිදු කරන ලද සම්මුඛ සාකච්ඡාවක දී මිනෙසොටා විශ්වවිද්‍යාලයෙහි ස්නායු වෛද්‍ය රොනල්ඩ් ක්‍රැන්ෆෝඩ් දෙවන සීඒටී ස්කෑන් එකේ ප්‍රතිඵල නිරීක්ෂනය කලේ ය. "එයින් පෙන්නුම් කෙරුනේ මස්තිෂ්ක බාහ්‍යකය ශේෂ ව නො තිබුනු බව ය .... සීඒටී ස්කෑන්ස් නිරීක්ෂනය කරන කවර ස්නායු වෛද්‍යවරයකු හෝ විකිරනවේදියකු හෝ ඔබට පවසනු ඇත්තේ ඇගේ මොලයෙහි ක්ෂය වීම ඊට වඩා දරුනු විය නො හැකි බව ය."

හෙන්ටොෆ්ගේ කොලමෙන් එල්ල කෙරී තිබුනු බොහෝ මඩ ගැසීම්, ෆ්ලොරිඩාවේ ආන්ඩුකාර ජෙබ් බුෂ් වෙත 2003 දෙසැම්බර් පලමු වන දා ඉදිරිපත් කෙරුනු නිල වාර්තාවෙන් නිෂ්ප්‍රභ කෙරේ. එම වාර්තාව ඉදිරිපත් කලේ ජේ. වුල්ෆ්සන් ය. ඔහු ෂියාවෝ මහත්මියගේ නඩු ක්‍රියාවලියෙහි භාරකරු ය. ඔහු පත් කෙරී ඇත්තේ ෆ්ලොරිඩාවේ රාජ්‍ය නීතියට අනුව හා ෆ්ලොරිඩාවේ 6 වන සංචාරක අධිකරනයේ ප්‍රධාන විනිශ්චයකාරයාගේ නියෝගයට අනුව ය. එම වාර්තාවෙන් ෂියාවෝ මහත්මියගේ ස්නායු ආබාධයෙහි පරිමාවත් සවිඥාන ක්‍රියාවලීන් පුනස්ථාපනය කිරීමට

දරුනු ඉමහත්, එහෙත් නිෂ්ඵල ප්‍රයත්නයන් සවිස්තර ව ගෙන හැර දැක්වුනි. එහි දී දක්ෂිනාංශික මුසාවාද යන්ත්‍රනයෙහි ප්‍රකාශයන්ට ඍජු ව ම පටහැනි ව, දූෂිත ක්‍රියා කලාපයකට එරෙහි ව මයිකල් ෂියාවෝ විසින් පැවරුනු නඩුවකින් ෂියාවෝ මහත්මියට අයත් වූ මුදල්, පරිපූර්නයෙන් ම නිවැරදි ආකාරයෙන් ෂියාවෝ මහත්මිය වෙනුවෙන් වියපැහැදම් කල බවට සාක්ෂි එලවනු ලැබින. වාර්තාවෙන් මෙසේ ද කියවෙයි. "තෙරේසාගේ මූල්‍යමය ත්‍යාගය වෙනුවෙන් අධිකරනය අරමුදලක් පිහිටුවිය. එය පිහිටුවනු ලැබුනේ සවුත් ට්‍රස්ට් බැංකුව ආරක්ෂකයා හා ස්වාධීන ආරක්ෂකයා හැටියට ගනිමිනි. මෙම අරමුදල ඉතා සීරුවෙන් පරිපාලනය කෙරුනු අතර මයිකල් ෂියාවෝට ඒ සම්බන්ධයෙන් කිසිදු බලයක් නො වී ය. තෙරේසාගේ බූදලය සාවද්‍ය අයුරින් පරිපාලනය කෙරුනු බවට මෙම වාර්තාවෙහි කිසිදු සාක්ෂියක් නො වේ. මේ සම්බන්ධ වාර්තා ඉතා මැනවින් පවත්වා ගෙන ගොස් ඇත."

වසර හතරක් මුලුල්ලේ ඉතා ම මඳ වූ සවිඥාන භාවයක් හෝ ජනනය කිරීමට දැරුනු ප්‍රයත්න නිෂ්ඵල වූ විට, 1994හි දී, මයිකල් ෂියාවෝ යම් හෙයකින් තම බිරිඳගේ හෘදය වස්තුව නතර වුව හොත් එය සක්‍රිය කරවීමට කිසිවක් නො කරන්නැයි වෛද්‍යවරුන්ට දැනුම් දීමට ගත් තීන්දුව සම්බන්ධිත ව වුල්ෆ්සන් වාර්තාව මෙසේ සඳහන් කරයි:

"බෙහෙත් නො කිරීමට මයිකල් ගත් තීන්දුව තෙරේසාගේ වෛද්‍යවරයා හා පැවැත්වූ සාකච්ඡා පාදක කොට ගෙන ගනු ලැබුනකි. තෙරේසා සුව පත් වීමට කිසිදු අවකාශයක් නොමැති ය, යන්න පිලිබඳ ව මයිකල් තුල ඇති වූ විශ්වාසය ද එයට තුඩු දුන්නේ ය. යථාර්ථය අවබෝධ කර ගැනුමට මයිකල්ට වසර තුනකට වැඩි කාලයක් ගත විය. තෙරේසාට අවිඥාන නිෂ්ක්‍රිය තත්වයෙන් පැවතීමට ඉඩ දෙනවාට වඩා ස්වභාවික ව මිය යෑමට ඉඩ සැලසීම හොඳ යැයි යන්න මයිකල් අවබෝධ කර ගනිමින් සිටියේ ය".

තෙරේසා ෂියාවෝ අඛන්ඩ ව නිෂ්ක්‍රිය තත්වයකින් සිටින්නේ ය යන රෝග විනිශ්චය පුහුනු ස්නායුවේදීන් විසින් කරනු ලැබුනක් වන අතර එය යලියලිත් තහවුරු කරනු ලැබුනි. නිෂ්ක්‍රිය තත්වයකින් පසු වන පුද්ගලයකු ආබාධිත තැනැත්තකු නො වේ. එවැන්නකු ස්වයං සවිඥාන භාවයෙන් තොර වූවෙක් ද බාහිර ලෝකය සමග සවිඥාන සම්බන්ධතා පැවැත්වීමෙහි සියලු ශක්‍යතා අහෝසි වූවෙක් ද වන්නේ ය. ෂියාවෝ මහත්මියගේ තත්වය සාවද්‍ය ලෙස ගෙන හැර දැක්වීම — මෙය වනාහි මුසාවාද බිනීමෙහි හා මුග්ධ භාවයෙහි නිෂ්පාදිතයකි — "ටෙරී ආරක්ෂා කරනු" උද්ඝෝෂනයේ ඉතා ම ජුගුප්සජනක ලක්ෂනයන්ගෙන් එකක් වෙයි. නිෂ්ක්‍රිය භාවය *නිව් ඉන්ග්ලන්ඩ් ජර්නල් ඔෆ් මෙඩිසින්* නමැති කෘතියෙහි මෙසේ විස්තර කෙරේ:

"තමන් ගැනත් වටපිටාව ගැනත් පරිපූර්න නො දැනුවත්කමින් යුක්ත සායනික තත්වයක්. හයිපෙතැලමසෙහි හා මොලයේ මුලෙහි ස්වතන්ත්‍රි ක්‍රියාවන් මුලුමනින් ම නැතිනම් ආංශිකව ආරක්ෂා වී පවත්නා නින්දෙන් හා අවදියෙන් සමන්විත තත්වයකි.

එය, මොලයේ දරුනු, තියුනු හෝ ව්‍යාධිගත හානි තත්වයක සිට සුවවීමේ අවස්ථාවක් නියෝජනය කරන අනිත්‍ය තත්වයක් විය හැකි ය. නැතහොත් එවන් හානි තත්වයකින් සුවය ලැබීමට අපොහොසත් වීමේ ප්‍රතිවිපාකයක් ලෙස ඇතිවන නිත්‍ය තත්වයක් විය හැකි ය. නිෂ්ක්‍රිය තත්වය අඛන්ඩ පරිහානි ගත වීමේ සන්තතියකින් හෝ ධාතුමය ස්නායු රෝගාබාධයකින් හෝ එසේත් නැත්නම් ස්නායු පද්ධතියේ වර්ධනයේ විකෘතීන්ගෙන් හට ගැනිය හැකි ය.

"නිෂ්ක්‍රිය තත්වය පිලිබඳ ව පහත දැක්වෙන අංග ලක්ෂනයන්ට අනුකූල ව, රෝග නිර්නය කල හැකි ය: 1. තමන් ගැන ම හෝ පරිසරය ගැන හෝ දැනුවත් බවට සාක්ෂියක් නො වීම සහ අන්‍යයන් සමග අන්තර් - ක්‍රියා කිරීමේ අපොහොසත්කම;

2. දෘෂ්‍ය, ශ්‍රව්‍ය ස්පර්ශ විෂයක හෝ අනිෂ්ට ප්‍රබෝධ කාරකයන්ට දැක්වෙන නිරන්තර ප්‍රතිනිර්මානාත්මක හෝ ස්වේච්ඡාමය ප්‍රතිචාරයන් ගැන සාක්ෂියක් නො වීම; 3. භාෂාමය අවබෝධය හෝ ප්‍රකාශන ශක්තිය පිලිබඳ ව සාක්ෂියක් නො වීම; 4. නින්ද හා අවදි වීම චක්‍රාකාරව සිදුවීම මගින් පෙන්නුම් කෙරෙන කඩින්කඩ අවදි වීම; 5. වෛද්‍ය හා සාත්තු සේවාවන්හි පිහිටෙන් ජීවත් වීමට ඉඩ සලසන තරම් මට්ටමකින් හයිපොතැලමසෙහි හා මොලයේ මුලෙහි ස්වතන්ත්‍ර ක්‍රියාවන් ආරක්ෂා වී පැවතීම; 6. අන්ත්‍රයේ හා මුත්‍රාශයේ අසංයම තත්වය; සහ 7. කපාල ස්නායුවේ ප්‍රතීක ක්‍රියාවන් සඳහා ඇති හැකියාව ආරක්ෂා වී පැවතීම විචල්‍ය ය....

"නිෂ්ක්‍රිය තත්වයකින් පසු වන රෝගීහු සාමාන්‍යයෙන් නිෂ්චල නො වෙත්. අර්ථ විරහිත ආකාරයට ඔවුන් තම සිරුර හෝ අඟපසඟ හෝ සෙලවිය හැකි ය. ඔවුන් ඉඳහිට සිනා විය හැකි ය. ඇතමෙකු කඳුලු හෙලන්නට ද පුලුවන. ඇතැමූන් යටි උගුරෙන් ශබ්ද නැඟීමට, වඩා දුර්ලභ අවස්ථාවන්හි කෙඳිරි ගෑමට හෝ කෑ ගැසීමට ද පුලුවන. එවන් ක්‍රියාකාරිත්වයන් කිසිදු ස්ථිරසාර භාවයකින් හා අරමුනකින් තොර වන අතර ඒවා සම්බන්ධීකරනය කෙරෙන්නේ බාහිර උත්තේජකයකට දක්වන අධෝබාහික, නෛසර්ගිකව අනුකරනය කෙරුනු, ප්‍රතීක ප්‍රතිචාරයක කොටසක් ලෙස ප්‍රකාශයට පත් වූ විට පමනි.

මෙම යාන්ත්‍රික ක්‍රියාකාරීත්වයන් අරමුනු සහගත ක්‍රියාවන් හැටියට සාවද්‍ය ලෙස පෙනී යා හැකි ය. එහෙත් මෙම ප්‍රතිචාර පරෙස්සම් සහගත අධ්‍යයනයන්හි දී මානසික දැනුවත්කමක් හෝ දැනුවත් හැසිරීම් විලාශයක් හෝ පිලිබඳ සාක්ෂි නොමැති රෝගීන් කෙරෙහි ද දක්නට ලැබී ඇත."

ටෙරී ෂියාවෝට පැවැත්ම කෙබඳු වී දැයි කල්පනය කිරීමට අපට නුපුලුවන. මන්ද, ඇය පසු වූ තත්වය කල්පනයට අවකාශයක් නො දෙන හෙයිනි. ටෙරීට

තමන්ගේ තත්වය ගැන සිතන්නට නුපුලුවන් විය. මන්ද, මොලයේ සිතන්නට හඟින්නට උපයෝග කර ගැනෙන කොටස, දිගු කලක් ඔක්සිජන් නො ලැබීම කරන කොට ගෙන විනාශ වී තිබුනු හෙයිනි. ෂියාවෝ මහත්මිය පිළිබඳ සායනික පරීක්ෂන ඇගේ මොලය පිලිබඳ සී.ඒ.ටී. ස්කෑන්වලින් පැහැදිලි ව ඇඟවුම් කෙරුනු තතු සනාථ කෙරුවා පමනි. ෂියාවෝ මහත්මිය නිෂ්ක්‍රිය තත්වයකින් පසු වූවා ය යන්න ප්‍රතික්ෂේප කිරීමට දැරෙන උත්සාහයන් — ෂින්ඩ්ලර්වරු ඔවුන්ගේ නඩුහබ පිලිබඳ උද්ඝෝෂනයේ ඉතා ම මෑතක් වන තුරු ම, ෂියාවෝ මහත්මිය නිෂ්ක්‍රිය තත්වයකින් පසු වූවා ය යන්නට අභියෝග නො කලහ — යුක්තියුක්ත යැයි ඒත්තු යනු ඇත්තේ සවිඥාන භාවය මොලයේ කායික රසායනික සන්තතීන් මත පදනම් වන්නේ ය යන විද්‍යාත්මක කරුන ප්‍රතික්ෂේප කරන්නවුන් හට පමනි.

ෂියාවෝ සිද්ධියෙහි භයංකර රහස්වලින් එකක් නම් ඇගේ දෙමාපියන් වසර පහලොවකට පසුවත් තම දියනියගේ මූලික කායික පැවැත්ම පිලිගත්තේ ඇයි ද යන්න යි. මාපිය සෙනෙහස තුල මෙයට පිලිතුර සොයා ගත නො හැකි ය. මන්ද එබඳු ආදරයක අතිශයින් ම මූලික හා සහජාශමය අංගය, දරුවකු වේදනා විඳීම වලක්වාලීම වන හෙයිනි. ෂින්ඩ්ලර්වරුන් අවධාරනය කල පරිදි ඔවුන්ගේ දියනියට තම තත්වය පිලිබඳ ව අව ම මට්ටමේ දැනීමක් වී නම්, ඇය සප්‍රානික ව තබා ගැනුමට ඔවුන් දරන ආයාසය කිව නොහැකි තරම් කෲර වන්නේ ය. ඇත්තටම, ආන්ඩුකාර ජෙබ් බුෂ් වෙත ඉදිරිපත් කල සිය වාර්තාව තුල දී, නඩු ක්‍රියාවලියෙහි භාරකරුට, .... ෂින්ඩ්ලර් පවුලේ ප්‍රකාශන හමුවෙහි තමන්ගේ විස්මය පාලනය කර ගැනුමට නො හැකි වූ තරම් ය; ඒ, ප්‍රකාශ සිදු කෙරුනේ දිග්ගැස්සුනු පූර්ව විනිශ්චය නඩු විභාගයෙහි දී හා 2000 ජනවාරි - පෙබරවාරි නඩු විභාගයෙහි දී ය. මෙම නඩු විභාගය අවසන් වූයේ ටෙරී ෂියාවෝගේ ශරීරයෙන් පෝෂක නාල ඉවත් කිරීමට අවසර දෙමින් ග්‍රියර් විනිශ්චයකරුවා දුන් නඩු තීන්දුවෙනි. වුල්ෆ්සන් මෙසේ වාර්තා කලේ යː

"නඩු විභාගය මුලුල්ලේ ම ෂින්ඩ්ලර් පවුලේ සාමාජිකයන් විසින් කරන ලද ප්‍රකාශ හා සාක්ෂි දීම් කෙරෙන් ප්‍රකට වූයේ තෙරේසා සප්‍රානික ව තබා ගැනුමට ඔවුන් මොනයම් ආකාරයකින් වුව ක්‍රියා කරති යි යන අසහනදායී විශ්වාසය යි. බියකරු නිදර්ශන ඉදිරිපත් කෙරින. යම් හෙයකින් තෙරේසාට දියවැඩියාව වැලඳුනහොත් ඒ අනුව ඇගේ අඟපසඟ පැසවුව හොත් ඒවා එකිනෙක කපා දැමීමට ඔව්හු එකඟත්වය පල කලහ. ඇයට හෘදයාබාධ වෙති යි රෝග විනිශ්චයක් කරනෑ ලැබුව හොත් හදවත විවෘත සැත්කමකට භාජන කිරීමට ද ඔව්හු එකඟ වූහ..... සාක්ෂි දීමේ දී ඉදිරිපත් කෙරුනු කල්පිතයන් හමුවෙහි ෂින්ඩ්ලර් පවුල කියා සිටියේ යම් හෙයකින් තෙරේසා ම කෘතිම පෝෂනය ඉවත් කිරීමේ තම අරමුන ප්‍රකාශ කලත් ඔවුන් එසේ නො කරන බව ය. මෙම වේදනාකර හා දුෂ්කර නඩු විභාගය මුලුල්ලේ ම, ෂින්ඩ්ලර් පවුල, තෙරේසා දිගින් දිගට ම නිෂ්ක්‍රිය තත්වයකින් පසු වන්නීය යනුවෙන් කෙරී තිබුනු රෝග විනිශ්චය පිලිගත්තේ ය.,

ෂින්ඩ්ලර්වරුන්ගේ ක්‍රියා පටිපාටිය, ඔවුන්ගේ දියනියගේ යහපත පිලිබඳ ව තර්කානුකූල සලකා බැලීම්වලට වඩා මූලධර්මාත්මක ආගමික අවශ්‍යතා විසින් හසුරුවනු ලැබුනේ ය යන්න විනා අනෙක් නිගමනයක් මේ සාක්ෂි දීම්වලින් උපුටා ගත නො හැකි ය. ඔවුන්ගේ විශ්වාසයට එරෙහි ව කෙතරම් විද්‍යාත්මක සාක්ෂි ඉදිරිපත් කෙරුන ද ෂින්ඩ්ලර්වරුන් හා ඔවුන්ගේ මූලධර්මවාදී සහකරුවන් ටෙරී ෂියාවෝ සිතන්නට, හඟින්නට අපොහොසත් ය යන්න පිලිබඳ ව ඒත්තු ගැන්වීමට පුලුවන් කමක් නො වීය. සත්තකින් ම ඔවුන්ගේ දෘෂ්ටියෙන් සලකා බලන කල්හි සවිඥාන භාවය 100 කෝටියක් නියුරෝන සහිත මොලයෙහි ද්‍රව්‍යමය කායික රසායනික සන්තතියක් ඇසුරෙන් අවබෝධ කර ගත යුත්තක් නො වේ; එය අවබෝධ කර ගත යුත්තේ ද්‍රව්‍යමය නො වන "ආත්මයකින්" හට ගැනෙන්නක් හැටියට ය.

ෂියාවෝ මහත්මිය, තමන් ම, සප්‍රානික ව නො පැවතීමට ඇගේ අවශ්‍යතාව ප්‍රකාශයට පත් කලත් ජීවිත පරිපෝෂක නාල ඉවත් කිරීම ඔවුන් අනුමත නො කරන බව ෂින්ඩ්ලර්වරුන් කල ප්‍රකාශය ෂියාවෝ මහත්මියගේ ඉරනම සම්බන්ධයෙන් නීතිමය අරගලයේ අරටුව වෙත අප කැඳවා ගෙන යයි. මූලධර්මවාදී දක්ෂිනාංශයත්, බුෂ් පරිපාලනය තුල සිටින ඔවුන්ගේ සගයනුත්, යථාර්ථය ඔලුවෙන් සිටවීමට දැරූ ප්‍රයත්නයේ දී "ටෙරී බේරා ගැනුමේ" ඔවුන්ගේ ව්‍යාපාරය "ජීවත් වීමට ඇති අයිතිය ආරක්ෂා කරන්නක්" හැටියට පෙන්නුම් කිරීමට උත්සාහ දැරින. එහෙත් ෂියාවෝ සිද්ධියෙන් සැබවින් ම ඉස්මතු කෙරුනු, එසේ ම සාරාර්ථ වශයෙන් ම සැබෑ වූ ප්‍රජාතාන්ත්‍රික අයිතිය නම්, රාජ්‍යයේ බලපෑමෙන් තොර ව ස්වකීය ශරීරයන් මත පරිපාලනය පැවැත්වීමට සියලුම පුද්ගලයන්ට පවත්නා අයිතිය යි. මෙහි දී එම අයිතිය නම්, තෙරේසා ෂියාවෝට කෘත්‍රිම වශයෙන් ඇගේ ජීවිතය දිග්ගැස්සීම නතර කිරීමට පවත්නා අයිතිය ආරක්ෂා කිරීම යි.

බුෂ් පරිපාලනය හා වෙනත් දක්ෂිනාංශික දේශපාලනික - ආගමික සංවිධාන විසින් "ජීවත් වීමට ඇති අයිතිය" යන වගන්තිය උපයෝග කර ගැනෙන ආකාරය ඇමරිකානු නීතිය තුල මෙම සංකල්පය දරන අර්ථයට සපුරා ම ප්‍රතිවිරුද්ධ අර්ථයක් උසුලයි. 1890හි දී ලුවිස් ඩී. බ්‍රැන්ඩීස් හා සැමුවෙල් ඩී වොරන්, *හාවර්ඩ් ලෝ රිවීව්* නමැති ප්‍රකාශනයට ලියූ ප්‍රමුඛ පෙලේ ලිපියකින් සාමාන්‍ය නීතියෙන් පිලිගනු ලැබෙන "ජීවත් වීමට ඇති අයිතියෙහි" පරිනාමය වන්නා වූ නීතිමය අර්ථය සාකච්ඡා කලෝ ය. (මෙය නිදහස පිලිබඳ ප්‍රකාශනයෙහි අන්තර්ගත ය) යුක්ති යුක්ත ව අගය කෙරෙන ඡේදයකින් බ්‍රැන්ඩීස් හා වොරන් සඳහන් කලේ "දැන් ජීවත් වීමට ඇති අයිතිය, ජීවිතය ආස්වාදනය කිරීමට ඇති අයිතිය තමන්ගේ පාඩුවේ

සිටීමට ඇති අයිතිය..." යන අර්ථ උසුලන බව ය. මෙම ලිපියෙන් පුද්ගලිකත්වයට ඇති නීතිමය අයිතිය සම්බන්ධිත ව බුද්ධිමය සැතපුම් කනුවක් සනිටුහන් කෙරුනේ ය.

බ්‍රැන්ඩීස්ගේ හා වොරන්ගේ තර්කනයෙහි වැදගත් ප්‍රජාතාන්ත්‍රික ඇඟවීම් ප්‍රත්‍යක්ෂ කර ගැනුනේ වසර 75කට පසු ව, 1965 දී ශ්‍රේෂ්ඨාධිකරනය විසින් *කනෙක්ටිකට් ප්‍රදේශයට එරෙහි ව ග්‍රිස්වර්ල්ඩ්* යන නඩුවෙහි දී දෙනු ලැබුනු අතිශය වැදගත් තීන්දුව මගිනි. එමගින් පුද්ගලික කටයුතුවල දී ආන්ඩුවේ බලපෑම්වලින් පුද්ගලයන්ගේ නිදහස ආරක්ෂා කරනු ලැබින. මෙම නඩු තීන්දුවට තුඩු දුන් විශේෂිත මතභේදය පැන නැගුනේ කනෙක්ටිකට් ආන්ඩුව, එස්ටෙල් ග්‍රිස්වල්ඩ්ට එරෙහි ව පැවරූ නඩුවෙනි. එස්ටෙල් ග්‍රිස්වල්ඩ් සැලසුම් ගත මාපියවරුන්ගේ සංගමයෙහි අධ්‍යක්ෂකවරියකි. ඇයට එරෙහි ව නඩු පැවරුනේ 19 වන ශත වර්ෂයට අයත් රාජ්‍ය නීතියක් බන්ධනය කිරීම පිලිබඳ ව ය. එකී නීතියට අනුව විවාහක පුද්ගලයන්ට දරු උපත් වැලැක්වීමේ ක්‍රම උපයෝග කර ගැනුම පිලිබඳ ව උපදෙස් හෝ වෛද්‍ය උපදෙස් දීම සාපරාධී ක්‍රියාවක් විය. ශ්‍රේෂ්ඨාධිකරනය ග්‍රිස්වල්ඩ් මහත්මියට එරෙහි ව නඩු පැවරුනු රාජ්‍ය නීතිය නීති විරෝධී යැයි ප්‍රකාශයට පත් කලේ ය. පුද්ගලයන් "පුද්ගලිකත්වය රජයන ක්ෂේත්‍රයක්" ආස්වාදනය කල යුතු යැයි ශ්‍රේෂ්ඨාධිකරනය පැහැදිලි ව සඳහන් කලේ ය - එම ක්ෂේත්‍රයට රාජ්‍යයට නීතිමය වශයෙන් ඇඟිලි ගැසීමට නුපුලුවන. මෙම නඩු විභාගයට අනුව උසාවිය උපත් පාලන ක්‍රම උපයෝග කර ගැනුම පිලිබඳ ක්ෂේත්‍රය "පුද්ගලිකත්වය රජයන ක්ෂේත්‍රයක්" හැටියට තහවුරු කලේ ය.

මෙම ග්‍රිස්වල්ඩ් නඩු තීන්දුව නීතිමය මං සලකුනක් වන වේඩ්ට එරෙහි ව රෝ නමැති නඩු තීන්දුවට පදනම විය. 1974 හි මෙම නඩු තීන්දුව ගබ්සා කිරීමේ අයිතිය තහවුරු කලේ ය. 1975හි දී ප්‍රශ්නය වෙනත් ස්වරූපයකින් ඉදිරිපත් විය. එය කැරන් ඈන් ක්වින්ලන් නමැති තරුන කාන්තාවක සම්බන්ධිත නඩු විභාගයක් විය. එය මත් ද්‍රව්‍ය හා මධ්‍යසාර භාවිතයෙහි ප්‍රතිඵලය වශයෙන් හට ගැනුනු දැවැන්ත, ආපසු හැරවිය නො හැකි මොලයේ ආබාධයක් සම්බන්ධිත ප්‍රශ්නයක් විය. ක්වින්ලන්ගේ නිෂ්ක්‍රිය තත්වය සුව කල නොහැකි බව පැහැදිලි වූ විට ඇගේ දෙමාපියන් කෘතිම ශ්වසන උපකරන ඉවත් කිරීමට අවසර ඉල්ලා සිටියහ.

නිව් ජර්සි ප්‍රදේශයේ සංචාරක උසාවියක් ආරම්භක වශයෙන් මෙම ඉල්ලීමට අවසර දීම ප්‍රතික්ෂේප කලේ ය. ඉක්බිති ව ජනපදයේ ශ්‍රේෂ්ඨාධිකරනයට අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබින. *ග්‍රිස්වල්ඩ්* නඩුවෙන් උපුටා දක්වමින් පුද්ගලිකත්වයට ඇති අයිතිය "ඇතැම් කොන්දේසි යටතේ ප්‍රතිකාර ප්‍රතික්ෂේප කිරීමට තීන්දුවක් ගැනුමට රෝගියෙකුට පවත්නා අයිතිය අන්තර්ගත කර ගැනුමට පුලුවන් වන පමනට පෘථුල වන බව" ශ්‍රේෂ්ඨාධිකරනය විසින් තීන්දු කරනු ලැබින. "ඇතැම් කොන්දේසි යටතේ ගර්භිනී භාවය නතර කිරීමට තීන්දුවක් ගැනුමට ස්ත්‍රියකට ඇති අයිතිය අන්තර්ගත කර ගැනුමට තරම් පුද්ගලිකත්වයට ඇති අයිතිය පෘථුල වන්නාක් මෙනි."

පහල උසාවියේ තීන්දුව නිෂ්ප්‍රභ කිරීමට දී තමන්ගේ "කිසිදු පසුබට වීමක් නොමැති බව" නිව් ජර්සි උසාවිය ප්‍රකාශ කලේ ය. "බාහිර වශයෙන් බලපෑම් දැමීමට රජයට පවත්නා අවශ්‍යතාවට, කැරන් හට දැරිය නො හෙන තත්වයක් උද්ගත කරවීමට, සීමිත මාස ගනනකට නිෂ්ක්‍රිය ව දිවි ගෙවන්නට ඇයට බල කිරීමට, සවිඥාන ඥානාන්විත පැවැත්මකට ආපසු ඒමේ සැබෑ හැකියාවක් නොමැති ව දිවි ගෙවන්නට" ඇයට බලපෑම් දැමීමට නුපුලුවන් බව ශ්‍රේෂ්ඨාධිකරනය ප්‍රකාශ කලේ ය. කැරන් ඈන් ක්වින්ලන් කිසිදු ප්‍රකාශක් කර නො තිබුනි. උසාවිය සෘජු ව ම ප්‍රකාශ කලේ එම තරුන කාන්තාවගෙන් ප්‍රශ්න කිරීමේ හැකියාව තිබිනි නම් ඇය තම ජීවිතය දීර්ඝ කර ගැනුමට පවතින අකැමැත්ත පල කරනු ඇති ය යනුවෙනි. මෙම පදනම මත උසාවිය ඇගේ දෙමාපියන්ට තම දියනිය වෙනුවෙන් පුද්ගලිකත්වය සඳහා පවතින අයිතිය තහවුරු කිරීමට අවසර දුන්නේ ය. කෘතිම ශ්වසන උපකරන ඉවත් කෙරින. එහෙත් ක්වින්ලන් මිය ගියේ තවත් වසර හතක් නිෂ්ක්‍රිය ව ජීවත් වීමෙන් අනතුරු ව ය.

කෘතිම වශයෙන් ජීවිතය පවත්වා ගෙන යාම ප්‍රතික්ෂේප කිරීම පිලිබඳ ඊලඟ තීරනාත්මක සිද්ධිය නැන්සි ක්‍රූසන් සම්බන්ධිත ය. මෙම විසි පස් හැවිරිදි කාන්තාව මිසූරි මාර්ගයේ දී මෝටර් රථ අනතුරකට භාජන විය. එයින් ඈ නිෂ්ක්‍රිය ජීවිතයකට ඇද වැටුනා ය. යලි වතාවක් තම දරුවා කෙරෙන් කෘතිම ශ්වසන උපකරන ඉවත් කිරීමට මැදිහත් වූයේ — ආදරනීය දෙමාපියන්ගෙන් අපේක්ෂා කල හැකි වන පරිදි ම — ඇගේ මව්පිය දෙදෙනා ය.

තමන් දියනිය විසින් කරන ලද ප්‍රකාශ මත පදනම් ව කටයුතු කරන බව මව් පිය දෙදෙන කියා සිටියහ. නැන්සි ක්‍රූසන්ට කෘතිම වශයෙන් ජීවත් වීමට සැලැස්වූ ආරෝග්‍ය ශාලාව මව්පියන්ගේ ඉල්ලීමට කන් නුදුන්නේ ය. ප්‍රතිඵලය වූයේ ප්‍රශ්නය උසාවිය හමුවට පත් වීම යි. නඩුව අවසානයෙහි උසාවිය ජීවන උපකරන ඉවත් කරන ලෙස ආරෝග්‍ය ශාලාවට දැනුම් දුන්නේ ය; ටෙරී ෂියාවෝට මෙන් ම ඇයටත් කෘතිම පෝෂනය හා දියර දෙනු ලැබුනි. ජනපදය පහල උසාවියේ නියෝගයට එරෙහි ව අභියාචනයක් ඉදිරිපත් කලේ ය. තර්කනය වූයේ නැන්සි ක්‍රූසන්ගේ ඉල්ලීම් ඇති තරම් පැහැදිලි නැත යන්නයි. මිසූරි ශ්‍රේෂ්ඨාධිකරනය රජයට එකඟත්වය පල කලේ ය. ඒ අනුව කෘතිම ජීවනය කෙලවර කිරීමේ පහල උසාවියේ නඩු තීන්දුව පෙරලා දමනු ලැබින. ඉක්බිති ප්‍රශ්නය එක්සත් ජනපද ශ්‍රේෂ්ඨාධිකරනය හමුවට පත් කෙරින.

එහි බහුතරය මිසූරි ශ්‍රේෂ්ඨාධිකරනයේ තීන්දුව පිලිගත්තේ ය. ජනපදය විසින් රෝගියාගේ කැමැත්ත පිලිබඳ ව පැහැදිලි හා ඒත්තු ගැන්වෙනසුලු ප්‍රකාශනයක්

ඉල්ලා සිටීම යුක්ති විරහිත නො වේ යැයි ද එයින් පුද්ගලිකත්වයට ඇති අයිතිය බන්ධනය නො වේ යැයි ද තර්ක කරනු ලැබින. නඩුව තීන්දු කරනු ලැබුනේ අධිකරන පටිපාටියට අනෘකූල ව ය. ශ්‍රේෂ්ඨාධිකරනය පැහැදිලි ව ම මෙසේ ප්‍රකාශ කලේ ය: "එක්සත් ජනපද ව්‍යවස්ථාව, සුදුසු කෙනෙකුට ජීවිතාරක්ෂක දියර හා පෝෂනය ප්‍රතික්ෂේප කිරීමට පවත්නා, ව්‍යවස්ථාවෙන් ආරක්ෂිත අයිතිය ලබා දෙනු ඇතැයි අපි විශ්වාස කරමු"

වැදගත් හා සානුකම්ප විරෝධයක් පාමින් ශ්‍රේෂ්ඨාධිකරනයේ විනිශ්චයකාර විලියම් බ්‍රෙනන් චතුර ලෙස තර්ක කලේ, මිසූරි ජනපදයේ පරිපාටීන් නැන්සි ක්‍රූසන්ට අනවශ්‍ය වෛද්‍ය මැදිහත් වීම්වලින් විමුක්ත ව සිටීමට ඇති අයිතිය මත "අවසර නොදිය හැකි පරිද්දෙන් බර පටවන බව ය". විනිශ්චයකාර ජෝන් පෝල් ස්ටීවන්ස් විරෝධය පෑ තවත් පුද්ගලයෙකි. ඔහු තීරනාත්මක ව වැදගත් වන ප්‍රශ්නයක් නැගුවේ ය. එනම් මිසූරි රාජ්‍යය "ආරක්ෂා" කිරීමට එතරම් ඕනෑකමක් දක්වන ජීවිතයේ ස්වභාවය ගැන ය. නැන්සි ක්‍රූසන් ඇගේ වටපිටාව පිලිබඳ ව අවිඥාන බවට හා සුව පත් වීමේ කිසිදු අවකාශයක් නොමැති බවට පවත්නා ඉමහත් සාක්ෂි සම්භාරය ද ඔහු ගෙන හැර දැක්විය. ක්‍රූසන් මහත්මිය සප්‍රාන ව තබා ගැනුමට බල කිරීමෙන් මිසූරි ජනපදය "මරනයට පත් වෙමින් සිටින පුද්ගලයන් මත ජීවිතයේ අර්ථය පිලිබඳ ව මතභේදයට හා විරෝධයට පාත්‍ර වන දෘෂ්ටියක් පටවන්නේ යැ"යි ද ඔහු සඳහන් කලේ ය. ස්ටීවන්ස්, මිසූරි ජනපදයේ ශ්‍රේෂ්ඨාධිකරනයේ විනිශ්චයකාර චාල්ස් බ්ලැක්මාර්ගේ අදහසක් එකඟතාවෙන් යුතු ව උපුටා දැක්විය. චාල්ස් බ්ලැක්මාර් බහුතරයේ තීන්දුවට විරෝධය පෑවේ ය:

"ජීවිතය ආරක්ෂා කිරීම පරමයක් ලෙස ගැනුම යථාර්ථවත් නො වේ. ජීවිතයේ ස්වභාවයත් සැලකිල්ලට ගත යුතු ය. මා මෙසේ පවසනුයේ නැන්සිගේ තත්වය යහපත් අතට පත් වීමේ අවකාශයක් නැතැ යි නඩුවේ විනිශ්චයකරු විසින් පවසනු ලැබීමේ සන්දර්භය තුල පමනි. ප්‍රධාන මතය මෙම නිගමනය පිලිගනී. අසාමාන්‍ය වෛද්‍ය ප්‍රතිකර්ම පිලිබඳ ව තීන්දු ගැනුමෙහි දී ජීවිතයේ ස්වභාවය පිලිබඳ ව සලකා බැලීම සුදුසු ය. උසාවිය සමග ගනුදෙනුවකට නො එලඹී මෙබඳු කාරනා ගැන තීන්දු ගන්නා උදවිය ස්ථිර වශයෙන් ම ජීවිතයේ තත්වය සැලකිල්ලට ගනිත්. අනතුරු ව රෝගියාට මුහුන දෙන්නට සිදු වන අප්‍රසන්න තත්වය සමග එය තුලනය කරත්. වේදනාව ජනනය කරන සාධකයන්ට නැන්සි ප්‍රතිචාර දක්වනු ඇති බවට සාක්ෂි තිබේ. ඇයට තම වටපිටාව පිලිබඳ ව දැනුවත්කමක් වේ නම් ඇගේ ජීවිතය ජීවමාන අපායක් වනු ඇත. ඇයට ප්‍රකාශයට පත් වීම පිනිස හෝ තම තත්වය වෙනස් කර ගැනුම පිනිස යමක් කිරීමට නුපුලුවන."

එක්සත් ජනපදයේ ශ්‍රේෂ්ඨාධිකරනයේ තීන්දුවට අනතුරුව මිසූරි ජනපදයෙහි දී නඩු ව තවදුරටත් විභාග කෙරුනි. එහි දී දියනියගේ කැමැත්ත පිලිබඳ ව මව්පියන්ගේ ප්‍රකාශ තවත් සාක්ෂිකරුවන් විසින් තහවුරු කරනු ලැබුනි. නැන්සි ක්‍රූසන් ජීවත් වීමට නො කැමති වනු ඇතැයි යන්න සනාථ කෙරෙන "පැහැදිලි හා ඒත්තු ගැන්වෙනසුලු" සාක්ෂි ඇතැයි මිසූරි ජනපදය එවිට පිලිගත්තේ ය. පෝෂනය කිරීමට හා දියර සම්පාදනය කිරීමට යොදා ගැනුනු නල ඉවත් කෙරින. සති දෙකක් ඇතුලත නැන්සි ක්‍රූසන් අභාවයට පත් විය.

ෂියාවෝ සිද්ධිය පිලිබඳ අධ්‍යයනයකින් වෛද්‍ය විද්‍යාව, ව්‍යවස්ථාමය නීතිය හා සදාචාර ධර්ම යන මේ සියල්ල ම ටෙරී ෂියාවෝට ඇගේ කැමැත්තට පටහැනි ව ජීවතුන් අතරෙහි තබා ගැනුමට දැරෙන උත්සාහයන්ගෙන් විමුක්ත වනු වස් තිබෙන අයිතියට පිටුබලය සපයන බව පැහැදිලි වෙයි. ටෙරී ෂියාවෝ සිද්ධිය සැලකිල්ලට ගත් කල්හි විශේෂයෙන් අසාමාන්‍ය වන කිසිවක් එහි නොමැති බවත් පැහැදිලි වෙයි. එබඳු අසාමාන්‍ය කරුනු මගින් එක්සත් ජනපද ආන්ඩුවත් ෆ්ලොරිඩාහි ජනපද ආන්ඩුවත් ටෙරී ෂියාවෝ කෘතිම ලෙස සප්‍රානව තබා ගැනුමට දරන ප්‍රයත්න යුක්ති යුක්ත කෙරෙන්නේ නැත. මෙම මතභේදයේ හේතුව සොයා ගත හැකි වන්නේ නීතිය තුල හෝ සදාචාර ධර්ම තුල නො ව දේශපාලනය තුල ය.

එක්සත් ජනපදයේ ඉතිහාසයේ ප්‍රථම වතාවට එහි ආන්ඩුව ආගම පාදක කර ගෙන සමාජික ඡන්ද දායක කොට්ඨාශයක් ගොඩනැංවීමට කටයුතු කරයි. ලෞකිකත්වය ප්‍රතික්ෂේප කිරීම, ආධිපත්‍යය දරන ජනාධිපති බුෂ්, ආගමික පුනර්ජීවන ව්‍යාපාරයක නායකයා ලෙස පත් කර ගැනුමට දැරෙන උත්සාහය — ඇමරිකානු ඉතිහාසයෙහි මේවාට සැබෑ පූර්වාදර්ශයක් නොමැත. ඇමරිකානු ජනරජයේ ව්‍යවස්ථාමය පදනම්වලට සපුරා ම පටහැනි වන පරිද්දෙන් බුෂ් පරිපාලනය විසින් පල්ලිය හා රාජ්‍යය එකිනෙක බද්ධ කරනු ලැබීමක් නියෝජනය කෙරේ. මෙය වනාහි ඇමරිකා එක්සත් ජනපදයේ ප්‍රජාතන්ත්‍රවාදයට විනාශකාරී ප්‍රතිඵල අත්පත් කර දෙන්නා වූ වර්ධනයකි. බුෂ් සහ රිපබ්ලිකන් පක්ෂය විසින්, දේශපාලනික හා නීතිමය තීන්දු උදෙසා උචිත මාර්ගෝපදේශකය හැටියට නිමක් නොමැති ව පෙන්වා දෙනු ලැබෙනුයේ බයිබලය යි; මෙය තාර්කික ව ගමන් කරනුයේ ලෞකික ව්‍යවස්ථාව සිඳබිඳලීමකට හා ප්‍රතික්ෂේප කිරීමකට ය. දේශපාලනික උද්ඝෝෂනයෙහි මෙවලමක් හැටියට ආගම උපයෝග කර ගැනුම ක්ෂමා විරහිත ව ගමන් කරනු ඇත්තේ ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදයේ පාදක ව්‍යුහයන් කඩා බිඳ දැමීමකටත් නොයෙක් අකාරයේ වාර්ගික ගැටුම් ඇවිලවීමකටත් ය.

කාල් රෝව්ගේ හා ඔහුගේ නිල හෙන්චයියලාගේ සකල විධ නරුමත්වය හා දෙපිටකාට්ටුකම තිබියදී ම දේශපාලනයෙහි ආගමික මූලධර්මවාදයේ වැඩෙන බලපෑම හුදෙක් හෝ මූලික වශයෙන් කාල් රෝව්ගේ හා ඔහුගේ හෙන්චයියලාගේ ගනන් බැලීම්වල

ප්‍රතිඵලයක් හැටියට දැකීම අති සරල වන්නේ ය. ප්‍රජාතාන්ත්‍රික ලෞකිකවාදයේ බිඳ වැටීම වඩා ගැඹුරු සමාජ සන්තතීන්ගේ ප්‍රකාශනයක් වෙයි. සාරාර්ථ වශයෙන් එහි මූලාශ්‍රය සොයා ගත යුතු වන්නේ පසුගිය ශත වර්ෂ කාලක පමන කාලය මුලුල්ලේ ඇමරිකානු සමාජයෙහි සිදු වූ ඉමහත් සමාජ ආර්ථික පරිවර්තනයන් තුල ය.

ඇමරිකානු සමාජයේ පාලක ස්ථරය සමන්විත වන්නා වූ කුඩා කොට්ඨාශයෙහි මවිත කරවනසුලු පොහොසත් වීම, ඒ හා සමග ම ප්‍රජාතාන්ත්‍රික නැඹුරුවකින් යුත් සුලුධනේශ්වරයකට මූලික පදනම සම්ප්‍රදායික ව සම්පාදනය කලා වූ මධ්‍යම සමාජ ස්ථරයෙහි පරිහානිය, සාමාන්‍ය ආර්ථික ධ්‍රැවාන්ත ගත වීම, ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය උදෙසා පවත්නා ඡන්ද කොට්ඨාශය තියුනු ලෙස බාදනය කර දමා ඇත. සැබෑ මහජන ආකර්ෂනයක් සහිත සමාජ ආර්ථික ක්‍රියා මාර්ගයක් ඉදිරිපත් කිරීමෙහි අපොහොසත් වන, පඩිපතින් පඩිපතට ජීවත් වන, ආර්ථික වශයෙන් අනාරක්ෂිත හා එන්නඑන්න ම වැඩිවැඩියෙන් අතෘප්තිමත් වන ජනගහනයකට මුහුන දෙන්නා වූ පාලක ස්ථරය තමන් කෙරෙහි මහජන සහයෝගය ජනනය කිරීමට ආගම තුල විකල්ප පදනමක් සොයා ගැනුමට උත්සාහ දරයි.

ඩෙමොක්‍රටික් පක්ෂය, ධනේශ්වර ආර්ථිකයෙහි පදනම මත නිර්ව්‍යාජ ජනප්‍රිය ක්‍රියා මාර්ගයක් වර්ධනය කිරීමෙහි ලා රිපබ්ලිකන්වරුන්ට වඩා පොහොසත් නො වේ. බුෂ් පාලනය ආගම උපයෝග කර ගන්නා විට රිපබ්ලිකන්වරුන්ට කල හැකි වනුයේ එයට අනුගත වීම පමනි. ඩෙමොක්‍රටික් පක්ෂයේ කොඳු ඇට විරහිත දේශපාලනඥයන් එකෙකු පසුපසින් එකෙකු ශෝචනීය ලෙස උත්සාහ දරනුයේ තමන්ගේ ආගමික අක්ත පත්‍ර ඔපලීමට ය. එසේ කිරීමේ දී ඔවුන් තමන්ගේ වංක භාවය හා මුග්ධ භාවය ප්‍රදර්ශනය කරනවා පමනි. තව ද ඔව්හු රිපබ්ලිකන්වරුන් හා ක්‍රිස්තියානි දක්ෂිනාංශය නීත්‍යනුකූල කිරීමට හා ශක්තිමත් කිරීමටත් පිටුබලය සපයති.

ධනේශ්වර පක්ෂවල ප්‍රතිගාමී දේශපාලනික ගමන් මග ඇති තරම් පැහැදිලි ය. එහෙත් එමගින් පෘථුල ජනතාවගේ වඩාත් ගැඹුරු දේශපාලනික හැඟීම් පිලිබිඹු කරනවා තබා ඔවුන් තුල ප්‍රතිචාරයක් වත් ජනනය කෙරෙනුයේ කිනම් පරිමානයකට ද? ටෙරී ෂියාවෝ සිද්ධියෙන් යමක් පෙන්නුම් කෙරෙනවා නම් ඒ, පෘථුල ඇමරිකානු ජනතාව තුල ක්‍රිස්තියානි දක්ෂිනාංශයට ඇත්තේ ඉතා සීමිත පිටුබලයක් පමනකි ය යන්න යි.

"ටෙරී බේරා ගැනුමේ" උද්ඝෝෂන වෙනුවෙන් ආන්ඩුවේ හා ජන මාධ්‍යවල සියලු උත්සාහයන් තිබිය දී ම මහජනතාවන් එයින් මුලා වූයේ නැත. වයෝවෘද්ධ දෙමාපියන්, සුව කල නො හැකි ස්වාමිපුරුෂයන් හා බිරින්දෑවරුන් සම්බන්ධිත ජීවන අත්දැකීම් විසින්, ඔව්හු රිපබ්ලිකන්වරුන්ගේ ආගමික වාචාල කතා කෙරෙන් සපුරා ම පිටස්තර කරනු ලැබූහ. ඡන්ද විමසන්නන් විසින් ප්‍රශ්න කරනු ලැබූ කල්හි වැඩිමනත් බහුතරයක් මයිකල් ෂියාවෝගේ ඉරනම කෙරෙහි අනුකම්පාව පල කලහ. ඡන්දය දුන්නවුන්ගෙන් සැලකිය යුතු බහුතරයක් කියා සිටියේ තමන් ෂියාවෝ සිටින තැන සිටියේ නම් ඔහු ගත් තීන්දුව ම — එනම් ජීවන පිටුබලය සපයන උපකරන ඉවත් කිරීමේ තීන්දුව ම ගන්නා බව ය.

එහෙත් ඇමරිකානු කම්කරු පන්තියේ දේශපාලනික නැඹුරුව මත ආගමික බලපෑම්වල පැහැදිලි වර්ධනය නො තකා සිටීම සරල මතික හා අදූර දර්ශී වන්නේ ය. මෙම වර්ධනය සැලකිලිමත් ලෙස අධ්‍යයනය කිරීමත් පැහැදිලි කිරීමත් අවශ්‍ය වන්නේ ය. ආගමික පුනර්ජීවනයට හේතු හැටියට, නරුම ධනේශ්වර දේශපාලනඥයන්ගේ හා ජුගුප්සජනක ජන මාධ්‍යවල විසකුරු බලපෑම දැක්වීම ප්‍රමානවත් නො වන්නේ ය. සෑම අවස්ථාවක දී මෙන් ම මෙහි දීත් දෘෂ්ටිවාදීමය ඒත්තු ගැනීම්වල මූලාශ්‍රය සොයා ගත යුතු වන්නේ සැබෑ ජීවන කොන්දේසි තුල ය.

ඇමරිකානු ජීවිතය මත ආගමෙහි වැඩෙන බලපෑමට හේතුව සංක්ෂිප්ත ව හෝ ගෙන හැර දැක්වීම පිනිස පසුගිය 25 වසර තුල ඇමරිකානු කම්කරු ව්‍යාපාරයෙහි පූර්න යැයි කිව යුතු තරම් වන කඩා වැටීමෙහි දුර දිග යන ප්‍රතිඵල අවධාරනය කිරීමට මම කැමැත්තෙමි. 1980 දශකයේ මුල් වසරවල කම්කරු පන්තියට විරුද්ධ ව අන්ඩුවේ පිටුබලය ඇති ව සමාගම් විසින් දියත් කෙරුනු ප්‍රහාරය හමුවෙහි, තමන්ගේ ම දේශපාලන බංකොලොත්කමෙහි හා බියගුලුකමෙහි ගොදුර බවට පත් වෘත්තිය සමිති, එක්සත් ජනපදය තුල සැලකිය යුතු සමාජ බලවේගයක් හැටියට අතුරුදහන් ව ගොස් ඇති තරම් ය.

සමාගම්වල ශක්තියට පාත්‍ර ලැබුනු ජනප්‍රිය විරෝධයේත් ජනතා සංවිධානයේත් මූලික රූපාකාරය වූ වෘත්තිය සමිති අතුරුදහන් ව යාම විසින් කම්කරුවන් හා ඔවුන් ජීවත් වන ආර්ථික ව්‍යුහයත් අතර සම්බන්ධතාව පෙරලිකාරී අයුරින් වෙනස් කර ඇත. අතීතයෙහි කම්කරුවන් මෙම ව්‍යුහයට මුහුනදුන්නේ කෙතරම් අප්‍රමානවත් ලෙස වුවත් පන්තියක් හැටියට ය; දැන් ඔවුන් මෙම ව්‍යුහයට මුහුන දෙන්නේ හුදකලා පුද්ගලයන් හැටියට ය. දැන් ඔවුන්ට ගැටලුවලට මුහුන දීමට බල කෙරෙනුයේ සමාජ සාමූහිකයක කොටසක් හැටියට නො ව තමතමන් හැටියට ය.

කම්කරුවන්ගේ ජීවිතවල ඇති කෙරී තිබෙන ඉමහත් සමාජමය හිස් තැන සපුරාලීමට ආගම ආධාරක වෙයි. පන්ති ව්‍යාපාරයක කොටසක් හැටියට තම අවශ්‍යතා වෙනුවෙන් සටන් කිරීමට අපොහොසත් වන කම්කරුවෝ තමන් ම තමන් වෙනුවෙන් සටන් කිරීම අවශ්‍ය යැයි විශ්වාස කරත්. ජීවිතයේ තැලීම් පෙලීම්වල දී තමන් දිරිමත් කරවීමට "ගෙයි මුල්ලක" ජේසු තබා ගැනුමේ අවශ්‍යතාව එහෙයිනි.

ඉතින් මෙය ජය ගත හැකි වනුයේ කෙසේ ද? බොහෝවිට කියනු ලැබෙන ආකාරයට සතුටුදායක ආරංචිය නම් වෛෂයික කොන්දේසි තමන් ම ක්ෂමා

විරහිත ව සමාජමය අරගලවල පුනර්ජීවනයකටත් පන්ති බලවේගවල අලුත් වෙනස් වීමකටත් යොමු වනු ඇති බව යි. ප්‍රතිගාමී දෘෂ්ටිවාද දිගින්දිගට ම බල පැවැත්වීම සමාජ අරගලවල වර්ධනයටත් වැඩි දියුනු වන පන්ති විඥානයටත් බාධකයක් වෙයි. එහෙත් එය පරම බාධකයක් නො වන්නේ ය. අවසාන විග්‍රහයේ දී ධනේශ්වර සමාජයේ වෛෂයික පරස්පර විරෝධයන් මහජනතාවන් අරගලයට මෙහෙයවමින් නිර්ව්‍යාජ බුද්ධිමය හා සමාජ ජීවිතයක් පුනර්ජීවනය හා සප්‍රාන කරවනු ඇත. එහෙත් ආගමික ගූඪවාදයේ හා පසුගාමිත්වයේ ග්‍රහනයෙන් මහජනතාවන්ගේ දෘෂ්ටිවාදීමය විමුක්ත වීම වෛෂයික බලවේගවල ස්වභාවික ක්‍රියාකාරිත්වයට පවරනු ඇත්තේ නො ගැඹුරු, අති සරල ස්වයං පරාජක ශුභවාදයකි. ඉතිහාසයේ අන් සෑම පරිච්ඡේදයක දී මෙන් ම දැනුදු ප්‍රගතිය සඳහා සටන් කල යුතු ය.

කම්කරුවන් සංවිධාන කිරීමේ ප්‍රායෝගික ප්‍රයත්නයන් වැදගත් වුව ද සටන ඊට සීමා නො වේ. කම්කරුවන් පන්තියක් හැටියට දේශපාලනික ව සංවිධාන කිරීමට දැරෙන ප්‍රයත්නයන්හි අත්‍යවශ්‍ය අංගයක් වනුයේ, ඔවුන්ගේ බුද්ධිමය හා සංස්කෘතික මට්ටම ඔසවා තැබීමට, සියලු ආකාරවල ආගමික මිථ්‍යා විශ්වාසයන්ට හා පසුගාමිත්වයට එරෙහි ව විද්‍යාත්මක චින්තනයේ බලය වෙනුවෙන් සටන් වදින්නට එනම් හුදෙක් සමාජයේ සමාජ ආර්ථික සම්බන්ධතා පිලිබඳ ව පමනක් නො ව මානුෂ විඥානයේ පදනම් හා ව්‍යුහය පිලිබඳ ව ද භෞතිකවාදී මාක්ස්වාදී අවබෝධයක් වෙනුවෙන් අරගලය කිරීම ය. අතීතයෙහි දී මෙන් ම සමාජවාදී ව්‍යාපාරය කම්කරු පන්තියට ඇති තමන්ගේ න්‍යායික හා තාර්කික වගකීම්වල පෘථුල පරාසය අවබෝධ කර ගත යුතු ය.

විද්‍යාව විසින් සමාජවාදී ව්‍යාපාරයට නව බුද්ධිමය අවිආයුධ රැසක් සම්පාදනය කර දීම පිලිබඳ කරුනින් අපට ඉමහත් ධෛර්යයක් උත්පාදනය කර ගත හැකි ය. ටෙරී ෂියාවෝ මතභේදයෙහි හරි මැද පවත්නා විද්‍යා ක්ෂේත්‍රය, ස්නායු ජීව විද්‍යාව, අද දින අතිශයින් ම විස්මජනක සොයා ගැනීම්වල ක්ෂේත්‍රය වීම උත්ප්‍රාසජනක ය. මොලය වනාහි සියලුම භෞතික ව්‍යුහයන් අතරෙහි වඩාත් ම සංකීර්න ප්‍රපංචය යි. මොලයේ කායික ස්වභාවය පිලිබඳ අවබෝධයෙහි පුදුම දනවනසුලු ප්‍රගතියක් ඇති වෙමින් පවතී. අනෙක් අතට මෙම ප්‍රගතිය මගින් මාක්ස්වාදය විසින් අරගලයෙන් ඉස්මතු කෙරෙන විඥානය හා සංජානනය පිලිබඳ අවබෝධය ද තහවුරු කෙරේ. පාලක කල්ලිය විශිෂ්ටතම විද්‍යාඥයන්ගේ සොයා ගැනීම් පිලිබඳ ව එතරම් බිය පත් වීම පුදුමයට කරුනක් නො වේ. ස්නායු ජීව විද්‍යාව පිලිබඳ ක්ෂේත්‍රයෙහි හා ඊට සම්බන්ධිත පර්යේෂන ක්ෂේත්‍රයන්හි මෙම විද්‍යාඥයන්ගේ සොයා ගැනීම් ආගමික ගූඪවාදයේ අවසන් පන නල ක්‍රමික ව විනාශ කරයි.

කම්කරු පන්තියට විද්‍යාවේ ආධාරය නොමැතිව පෙරට යාමට නුපුලුවන. එහෙත් විද්‍යාව උදෙසා කම්කරු පන්තියේ ම ප්‍රගතිය අවශ්‍ය වේ. අද දින එක්සත් ජනපදය තුල දේශපාලනික ප්‍රතිගාමීත්වයේ වර්ධනය විද්‍යාත්මක පර්යේෂකයා සිර ගත කොට තබයි. පුද්ගලික කම්කරුවාට තමන් ආරක්ෂා වීමට නුපුලුවන් වන අයුරින් ම හුදෙකලා විද්‍යාඥයාට හෝ විද්‍යාඥවරියට ද තමන්ගේ ආරක්ෂාව සලසා ගැනුමට නුපුලුවන. අවසාන විග්‍රහයේ දී පුද්ගලික පර්යේෂකයන්ගේ කායික ආරක්ෂාව සේ ම සමස්තයක් හැටියට විද්‍යාවේ ප්‍රගතියත් කම්කරු පන්තියේ නව විප්ලවීය උද්ගතය මත රඳා පවතී. අතිශයින් ම ගැඹුරු ඓතිහාසික අර්ථයකින් සලකා බලන කල්හි සමාජවාදී ව්‍යාපාරය විද්‍යාත්මක සත්‍යය ගවේෂනය කිරීමේ සියලුම ආකාර හා මානුෂ සමානත්වය පිලිබඳ අරගලය යන දෙක ම තම ධජය යටතේ ඒකාබද්ධ කරයි.

© www.wsws.org